# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,193 - 2020 සැප්තැම්බර් මස 11 වැනි සිකුරාදා - 2020.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| **ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :** | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| **ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| **ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම :** | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 158 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 160 |


සැ. යු.-(i) විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා (සංශෝධන) පනත් කෙටුම්පත 2020 අගෝස්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) මුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iii) වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(iv) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(v) ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත 2020 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2020 ඔක්තෝබර් මස 02 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 සැප්තැම්බර් මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

සබරගමුව පළාත් සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්, එච්. එම්. සී. සුසන්ත හේරත් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) වන උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1995 නොවැම්බර් මස 09 වැනි දින ප්‍රදානය කර ඇති අංක කෑ/ප්‍ර 08158 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන බටුවත්ත, කැකුණකන්ද වත්ත පදිංචි ලේකමලාගේ ජයරත්න වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ගලි 4/77 යටතේ 1995.11.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.10.09 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගන්දොලහ පත්තුවේ බටුවත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බටුවත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කෑගල්ල මැනුම් අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මූ. පි. කෑ. 1576 දරන පිඹුරේ අංක 04 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 01ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම්වූ ද රජයේ ඉඩම - කැකුණකන්ද වත්ත.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙන් බෙදන ලද ඉඩම, |
| *නැගෙනහිරට* | : | පොදු ලිඳ, ඉඩම සහ ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 03. |

එච්. එම්. සී. සුසන්ත හේරත්,
ප්‍රාදේශීය ලේකම්,
ගලිගමුව.

2020 ජූලි මස 09 වැනි දින.

09-219

---

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්, ශානික තිරිමාන්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.12.18 වැනි දින ප්‍රදානය කර ඇති කළු/ප්‍ර/3389 අංක දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රණවීරගේ ඩින්ගි අප්පුහාමි වෙත ප්‍රදානය කොට මතුගම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 26/185 යටතේ 1991.12.24 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.10.09 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උතුර මහපත්තුවේ 836 පැළෑද ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පැළෑද නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කළුතර සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක - දරන කට්ටි කැබීමේ පිඹුරේ - විසින් සම්පාදිත අංක අ.ග.පි. 132 දරන රේඛා සටහනේ අංක 699 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්/අක්කර - රූඩ් 03, පර්. 06 විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම - මහහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ. ග. පි. 132 හි කැ. අ. 698, 696 (පාර), |
| *නැගෙනහිරට* | : | අ. ග. පි. 132 හි කැ. අ. 696, (පාර) 724, |
| *දකුණට* | : | අ. ග. පි. 132 හි කැ. අ. 700, 721 සහ 724, |
| *බස්නාහිරට* | : | අ. ග. පි. 132 හි කැ. අ. 698, සහ 700. |

එස්. ත්‍රිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
පාලින්දනුවර.

2019 ජනවාරි මස 08 වැනි දින.

09-166/1

---

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

බස්නාහිර පළාත් සභාවේ, කළුතර දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්, අයිරංගනී වීරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1984.12.26 වැනි දින ප්‍රදානය කර ඇති අංක කළු/ප්‍ර/6513 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අරකවිල, කොස්වත්ත පදිංචි ලෙව්වන්දි පතිරණ්නැහැලාගේ ඇලෝසිංඤෝ වෙත ප්‍රදානය කොට පානදුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 21/24 යටතේ 1994.12.20 වැනි දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.10.09 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

කළුතර පරිපාලන දිස්ත්‍රික්කයේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහ පත්තුවේ රයිගම් කෝරළේ 625 අරකවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ අරකවිල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක මු. පි. ක. 1542 දරන කට්ටි කැබීමේ පිඹුරේ 07 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 13 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මූපික. 1542 ලොට් අංක 05 (ඇළ රක්ෂිතය), |
| *නැගෙනහිරට* | : | මූපික. 1542 ලොට් අක 08, |
| *දකුණට* | : | මූපික. 1542 ලොට් අංක 32 (පාර), |
| *බස්නාහිරට* | : | මූපික. 1542 ලොට් අංක 06. |

අයිරංගනී වීරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉංගිරිය.

2018 සැප්තැම්බර් මස 03 වැනි දින.

09-166/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

සබරගමුව පළාත් සභාවේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්, ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ ආණ්ඩුකාරවරයා විසින් 1964.11.02 දින ප්‍රදානය කර ඇති අංක ආර් 7420 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පිංහේනකැලේ ජනපදයේ පදිංචි කන්දෙවත්තේ යද්දෙස්සලාගේ සෙව්රංගා වෙත ප්‍රදානය කොට කෑගල්ල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක එල්. ඩී. ඕ. 77 යටතේ 1965.11.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2020.10.09 වැනි දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

**උපලේඛනය**

කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැද්දේමැදිලිය පත්තුවේ වැරැල්ලපත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැරැල්ලපත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, කෑගල්ල මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත ක්ෂේත්‍ර පත්‍ර 1 අවසාන ගම් සිතියම් අංක 105 හි කැබලි අංක 60 දරන අක්කර 0, රූඩ් 01, පර්. 32ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම පිංහේනකැලේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කට්ටි අංක 55 සහ 56, |
| *නැගෙනහිරට* | : | මාර්ග රක්ෂිතය, |
| *දකුණට* | : | මාර්ග රක්ෂිතය සහ කට්ටි අංක 64, |
| *බස්නාහිරට* | : | කට්ටි අංක 61. |

ඩබ්. එල්. ආර්. ඉන්දික ලියනගේ,
ප්‍රාදේශීය ලේකම්,
රඹුක්කන.

2020 ජූනි මස 06 වැනි දින.

09-349

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/60858.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/MAT/1/30/3/63.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැකණඳුර මධ්‍යම ග්‍රාම නිලධාරි වසමේ කැකණඳුර ගමේ මු. පි. මාර. 2790 පිඹුරේ කැබලි අංක 01 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2529ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා විදාන ගමගේ ප්‍රින්ස් ප්‍රසාද් මහතා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මුපි මාර 1695 හි කැබලි අංක 14, 8, 1 කේ. විතාරණ සහ තවත් අය හිමිකම් කියන රිට්ටිවත්ත නොහොත් කුරුඳුවත්ත මුපි මාර 293 හි කැබලි අංක 1 , |
| *නැගෙනහිරට* | : | මුපි මාර 293 හි කැබලි අංක 1 සහ මුපි පාර 1695 හි කැබලි අංක 5, 8, 10 සහ 19 , |
| *දකුණට* | : | මුපි මාර 1695 හි කැබලි අංක 5, 8,10, 19, 18, 17, 16, 13, 8 සහ 14, |
| *බටහිරට* | : | මුපි මාර 1695 හි කැබලි අංක 19, 18, 17, 16, 13, 8, 14, මාර්ගය (ප්‍රාදේශීය සභාව) සහ මුපි මාර 1695 හි කැබලි අංක 14, 8, 1. |

03. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජයේ අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය*.- අවුරුදු තිහයි (30) (2020.03.12 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල*.- බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන

තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) කට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතු ය.

*වාර මුදල :* වාර මුදලක් අය නොකෙරේ

*(ආ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඉ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.03.12 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 සැප්තැම්බර් මස 11 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, මිහිකත මැඳුර,
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-350

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/57707.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/MAT/1/30/3/27.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මාතර දිස්ත්‍රික්කයේ, මාතර කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 416 සී, කොටුව ග්‍රාම නිලධාරි වසමේ කොටුව ගමේ MR/MTR/2009/37 අංක දරන අනුරේඛනයේ කැබලි අංක A ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0753ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් වාණිජ කටයුතු සඳහා මාතර නීතිඥ සංගමයේ භාරකාර මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත සඳහන් වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | දකුණු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය , |
| *නැගෙනහිරට* | : | මාතර තානායම , |
| *දකුණට* | : | මුහුදු වෙරළ, |
| *බටහිරට* | : | පොලිස් උසාවි මාවත. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජයේ අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2020.02.04 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) කට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කළින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතු ය.

*වාර මුදල.-* වාර මුදලක් අය නොකෙරේ

*(ආ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම නීතිඥවරුන් සඳහා කාර්යාල සංකීර්ණයක් ඉදිකිරීමේ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ඇ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඈ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.02.04 දින සිට අවුරුදු 05 ක කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදු දීම්/පැවරීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 නොවැම්බර් මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-351

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/25000.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : SPLC/MAT/02/24/03/15.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 240 සී, පෝද්දන ග්‍රාම නිලධාරි වසමේ පෝද්දන ගමේ MR/KTP/2010/101 අංක දරන අනුරේඛනයේ කැබලි අංක E, F, H හා J දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2098ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ කටයුතු සඳහා කොස්මෝදර කර්ල් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ :

*කැබලි අංක* E

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 හා D කැබලි, |
| *නැගෙනහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක D කැබැල්ල, |
| *දකුණට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක G හා F කැබලි, |
| *බටහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 කැබැල්ල. |

*කැබලි අංක* F

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 E හා D කැබලි, |
| *නැගෙනහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක G කැබැල්ල, |
| *දකුණට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක J හා K කැබලි, |
| *බටහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 හා H කැබලි. |

*කැබලි අංක* H

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 කැබැල්ලෙන් කොටසක්, |
| *නැගෙනහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක J කැබැල්ල, |
| *දකුණට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 කැබැල්ලෙන් කොටසක්, |
| *බටහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 කැබැල්ලෙන් කොටසක්. |

*කැබලි අංක* J

| | | |
|---|---|---|
| *උතුරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284, F හා G කැබලි, |
| *නැගෙනහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක K කැබැල්ල, |
| *දකුණට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක M හා N කැබලි, |
| *බටහිරට* | : | මාර/KTP/2010/101 අනුරේඛනයේ අංක 284 හා H කැබලි. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන, එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජයේ අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* .- අවුරුදු තිහයි (30) (2020.02.04 දින සිට ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ

තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළෙඳපොළ වටිනාකමින් 2%කි. බද්ද ක්‍රියාත්මක වන වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) කට වැඩිවන අවස්ථාවල දී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05කට වරක්ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20%ක් එකතුවිය යුතු ය.

*වාර මුදල.*- වාර මුදලක් අය නොකෙරේ

*(අ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය.

*(ඇ)* සාදා ඇති ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතුය.

*(ඉ)* ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතු ය.

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ.

*(උ)* 2020.02.04 දින සිට අවුරුදු 05 ක අවම කාලයක් ඉක්මවීමට පෙර අතුරු බදු දීම්/පැවරීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

එන්. එම්. ටී. ජානිකා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2020 නොවැම්බර් මස 09 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
මිහිකත මැදුර, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

09-352